**ශීර්ෂ 183- මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 29 වන දින අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-----

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදන හා වියදම**

---------------------------

අමාත්‍යාංශයට සළසා තිබුණු රු.මිලියන 376.7ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු මිලියන 335.4 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.මිලියන 41.3 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10.9 ක් වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදන යේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 78.7 | 72.0 | 6.7 | 8.51 |
| මුලධන | 298.0 | 263.4 | 34.6 | 11.61 |
| **එකතුව** | **376.7** | **335.4** | **41.3** | **10.96** |

**2.2 අත්තිකාරම් ගිණුම**

-------------------

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

----------------------------------------------

අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18301 | 3.0 | 2.4 | 0.3 | 1.3 | 7.0 | 3.9 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

**-----------------------------**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0015/0195/000 දරන තැන්පත් ගිණුමේ රු මිලියන 11.5 ශේෂයක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

**---------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 183 - මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය**

**---------------------------------------------------------------**

**3.1 විසර්ජන ගිණුම**

**----------------**

**අයවැය විචලනය**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 කට සළසා තිබුණු එකතුව රු.350,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 12 කට අධි ප්‍රතිපාදන සළසා තිබිම නිසා උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 84 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**3.2.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

--------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදි 2014 දෙසැම්බර් 31 දිනට තොග ලේඛනයේ අගයන් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ තථ්‍ය අගයන් අතර වෙනස්කම් නිරික්ෂණය විය.

**3.4 අනුකූල නොවීම**

------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

-----------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104 | 782,111 | 2014 අප්‍රේල් 21 දින වාහනයකට සිදුවු අනතුර සම්බන්ධව පරික්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1642 | - | 2014 අප්‍රේල් 21 දින වාහනයකට සිදුවු හදිසි අනතුර සම්බන්ධයෙන් පොලිසියට වාර්තාකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | | වාහන 12 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ 2014 දෙසැම්බර් 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | | |
| 1989 දෙසැම්බර් 27 දිනැති අංක 62/89 දරන චක්‍රලේඛය | 419,055 | දිනපතා පුවත්පත්වලින් එක් පිටපතක් බැගින් (භාෂාත්‍රයෙන් අඩු වශයෙන් දෙකකින්) මිලදී ගැනීම කළ හැකි වුවත්, 2014 වර්ෂයේදී එක් දිනකට දිනපතා පුවත්පත් වර්ග 13 ක් බැගින් මිලදී ගෙන තිබුණි. |

**(ඈ) රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

| | | |
|---|---|---|
| 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛය | 880,000 | 2014 මැයි 5 දින සිට මැයි 15 දින දක්වා අමාත්‍යතුමා හා පෞද්ගලික ලේකම්වරයා විදේශ ගතවීම සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීම හා ගුවන් ගමන් සංවිධානය කර ගැනිමේ කටයුතු පෞද්ගලික සමාගමක් මගින් සිදුකර තිබුණි. |

**(ඈ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා**

| | | |
|---|---|---|
| 2004 මැයි 12 දිනැති අංක 04/0427/020/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | 863,590 | සියලුම ප්‍රචාරක දැන්වීම් රාජ්‍ය මාධ්‍ය ආයතන මගින් ඉටුකරවා ගත යුතු වුවත්, පෞද්ගලික සමාගම් 04 ක් මගින් එම කාර්යයන් සිදු කර ගෙන තිබුණි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

අමාත්‍යාංශයේ අනියම් කාර්ය මණ්ඩලයට 2014 වර්ෂයේදී වැටුප් ගෙවිමේදී සෑම දිනයකම එම කාර්ය මණ්ඩලය පැමිණි ලෙස සළකා වැටුප් ගෙවා තිබුණි. නමුත් එම නිලධාරින් වෙනුවෙන් පැමිණිමේ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර වැටුප් ගෙවීමේදී සමහර නිලධාරීන්ගේ වැටුප් අදාළ නිලධාරියා ලබා නොගෙන වෙනත් නිලධාරින් විසින් ලබා ගත් අවස්ථා නිරීක්ෂණය විය.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 03 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 40 | 23 | 17 |
| (iii) | ද්විතියක මට්ටම | 08 | 06 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 11 | 01 |
| | **එකතුව** | **66** | **43** | **23** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 23 ක් පිරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.